## බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෝර්ඩන්/සහකාර වෝර්ඩන් තනතුර සඳහා වන බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම.

"බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෝර්ඩන් /සහකාර වෝර්ඩන් තනතුර සඳහා වන අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ප්‍රකාරව බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින III ශ්‍රේණියේ වෝර්ඩන් /සහකාර වෝර්ඩන් **කාන්තා තනතුරු 02 ක්** සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරට අදාළ කාර්යයන්

- අධිකරණ නියෝග මත රැඳවුම් භාරයට පත්වන ළමුන් රඳවා තබන රැඳවුම් නිවාසයේ තාක්ෂණික විධානය,පරිපාලන නියාමනය,මූල්‍ය හා පොදු සියලුම කාර්යන් පිළිබඳව පැවරී ඇති වගකීම් අනුව කටයුතු කිරීම.

02. බඳවාගැනීමේ සුදුසුකම්

- අධ්‍යාපන සුදුසුකම් :
  i. අ.පො.ස. (සා.පෙළ) විභාගය එකවර සිංහල/දෙමළ භාෂාව,ගණිතය සහ තවත් විෂයන් 02කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06කින් සමත්ව තිබීම.

  සහ

  ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේ දී පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 04කින් /නව විෂය නිර්දේශය යටතේ විෂයන් තුන (03)කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) සමත් ව තිබීම

- පළපුරුද්ද :
  බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානවල වර්ෂ 03කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්දක් තිබීම

- කායික සුදුසුකම්
  i. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
  ii. බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

- වෙනත් සුදුසුකම්
  i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
  ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 3 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.
  iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් 2025.02.14 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල තමා විසින් සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

03. වයස් සීමාව : ( අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2025.02.14 දිනට)

- අවම වයස - අවුරුදු 22
- උපරිම වයස - අවුරුදු 40

04. වැටුප් පරිමාණය

ඒකාබද්ධ වැටුප - MN-1-2016 - රු.27,140-10x300 -11x350 -10x495 -10x660 - රු. 45,540

CamScanner

05. බඳවා ගැනීමේ ක්‍රමවේදය :( ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින්)

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙල මත ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා ඉහළම ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන ඇති අයදුම්කරුවන් අතරින් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| *1. අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය<br>අපේක්ෂකයාගේ භාෂා හැකියාව තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි* | පැය 01 | 100 | 40 |
| *2. සාමාන්‍ය දැනීම<br>ආර්ථික දේශපාලන අධ්‍යාපන සමාජයීය සංස්කෘතික විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කල ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.* | පැය 01 | 100 | 40 |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය**<br>*(වයස් මට්ටම් අනුව ළමුන්ගේ කායික හා මානසික චර්යාවන්, ළමා පෝෂණය හා සෞඛ්‍ය, ළමා රැකවරණය, ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුම ද, ළමුන් සමඟ කටයුතු කල යුතු ආකාරය පිළිබඳ අයදුම්කරු තුළ තිබිය යුතු ආකල්ප / අවබෝධය ද පරීක්ෂා කරනු ලැබේ.)* | 100 | 50 |

ඉහත ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා, ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහලම ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇති අයදුම්කරුවන් අතරින් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම කරනු ලැබේ.

06. සේවා කොන්දේසි :

6.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලට ද අනුව කටයුතු කල යුතුය.

6.2 භාෂා ප්‍රවීණතාවය

| භාෂාව | ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|---|
| 1. රාජ්‍ය භාෂාව | III | සේවය බැඳී ඇත්තේ රාජ්‍ය භාෂාවකින් නොවේ නම් පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | III | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය |
| 3. සන්ධාන භාෂාව | අදාළ නොවේ | |

07. විභාග දිනයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කල වලංගු ජාතික හැඳුනුම්පත,වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

CS CamScanner

### 08. විභාග ගාස්තු

- විභාග ගාස්තුව රු. 1200/- කි. මෙම මුදල බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ "විවිධ ආදායම්" ශීර්ෂ 20.03.02.99 ට බැර වන පරිදි බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය (බ.ප. 1 වැනි පොදු ආකෘති පත්‍රය) එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම වැදගත් වේ. බ.ප. 1 වැනි පොදු ආකෘති පත්‍රයේ මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇනවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ.
- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනෙන් පසු විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.
- ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

### 09. ලිඛිත පරීක්ෂණය පැවැත්වීම.

- නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති, බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්හට පමණක් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

### 10. අයදුම්පත් එවිය යුතු පිළිවෙල

- අයදුම්කරුවන් තම අයදුම්පත මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින්, තමා විසින්ම නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කල අයදුම්පත්‍රය 2025.02.14 දිනට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ තනතුරක් දරන අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය)

  ලේකම්,<br>
  සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,<br>
  කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත<br>
  8 වන මහළ, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල,<br>
  අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
  බත්තරමුල්ල.

- නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් නියමිත දිනට හෝ එදිනට පෙර නොලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පත්‍රය https://healthmin.wp.gov.lk ඔස්සේද බාගත කල හැකිය.

12. මෙම තනතුරට බඳවා ගැනීම හෝ නොගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

එල්.ඒ. කළුකපුආරච්චි<br>
ලේකම්,<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන,<br>
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ<br>
සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත<br>
2025.01. 13

එල්. ඒ. කළුකපුආරච්චි.<br>
ලේකම්<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සුභ සාධන,<br>
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ<br>
සභා කටයුතු [illegible] පළාත